සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

09916

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**87 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2014 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2014 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2014

| | | |
|---|---|---|
| **සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I, II** | | **පැය තුනයි** |
| தொடர்பாடலும் ஊடகக் கல்வியும் I, II | | மூன்று மணித்தியாலம் |
| Communication and Media Studies I, II | | *Three hours* |

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර** තෝරා ගන්න.
(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.

1. 'උපදෙස් සම්පාදනය' නමැති සන්නිවේදන කාර්යයට වඩාත් ගැළපෙන නිදර්ශනය තෝරන්න.
(1) පරිගණකයේ ඓතිහාසික විකාශය සිදුවූ අයුරු පැහැදිලි කිරීම
(2) පරිගණකයෙන් මුද්‍රණ පිටපත් ලබා ගන්නා අයුරු පැහැදිලි කිරීම
(3) පරිගණකය මගින් ලේඛනය වේගවත් වූ අයුරු පැහැදිලි කිරීම
(4) පරිගණක ආශ්‍රිත මුද්‍රණයේ ආකර්ශනීය බව පැහැදිලි කිරීම

2. පුවත්පතෙහි මුල් පිටුවේ පළවූ ප්‍රවෘත්තියක භාෂාමය දෝෂ කිහිපයක් ම ඇති බව ප්‍රධාන සංස්කාරකවරයා දුටුවේ ය. ඔහු එම කාරණය ගැන විමසීමට වඩාත් ම ඉඩ ඇත්තේ,
(1) ප්‍රවෘත්ති සංස්කාරකවරුන්ගෙන් ය. (2) සෝදුපත් බලන්නන්ගෙන් ය.
(3) පිටු සැකසුම්කරුවන්ගෙන් ය. (4) අක්ෂර සංයෝජකයන්ගෙන් ය.

3. සන්නිවේදනය සහ මාධ්‍ය අධ්‍යයනය පිළිබඳ සම්මන්ත්‍රණයේ දී අවධානය යොමු කළ විශේෂ කරුණු සියල්ල සාරාංශගත කර සියලු සිසු සිසුවියන් වෙත එදිනම ලබා දීමට විෂය භාර ආචාර්යවරියට අවශ්‍ය විය. මේ සඳහා වඩාත් උචිත මුද්‍රණ ශිල්ප ක්‍රමය වන්නේ,
(1) අංකිත අනුපිටපත් ක්‍රමයයි. (2) ඕෆ්සෙට් මුද්‍රණ ක්‍රමයයි.
(3) තිර පිටපත් ක්‍රමයයි. (4) පරිගණක මුද්‍රණ ක්‍රමයයි.

4. ප්‍රවෘත්ති සාකච්ඡාවක් යනු,
(1) ඒක මාර්ගික සන්නිවේදන අවස්ථාවකි. (2) දෙදෙනකු අතර සිදු කෙරෙන සාකච්ඡාවකි.
(3) තනි පුද්ගලයකු මෙහෙයවන රැස්වීමකි. (4) ද්වි මාර්ගික සන්නිවේදන අවස්ථාවකි.

5. ජනමාධ්‍ය ආයතනයක ප්‍රතිපත්ති සකස් කරනු ලබන්නේ,
(1) ග්‍රාහකයින් ය. (2) ජනමාධ්‍යවේදීන් ය.
(3) දැන්වීම්කරුවන් ය. (4) හිමිකරුවන් ය.

6. අන්තර් පුද්ගල සන්නිවේදනය බොහෝ විට,
(1) ශ්‍රව්‍ය හා කථන සන්නිවේදනයේ එකතුවකි. (2) වාචික හා නිර්වාචික සන්නිවේදනයේ එකතුවකි.
(3) දෘශ්‍ය හා වාචික සන්නිවේදනයේ එකතුවකි. (4) විධිමත් හා අවිධිමත් සන්නිවේදනයේ එකතුවකි.

7. ඓතිහාසික කතා පුවත් පදනම් වූ මාලා නාටක පිළිබඳ ග්‍රාහක රුචිකත්වය සොයා බැලීමට පාසල් මාධ්‍ය ඒකකය හා සම්බන්ධ සිසු සිසුවියන් තීරණය කරන ලදී. මෙම අධ්‍යයනය සඳහා තොරතුරු රැස් කිරීමේ දී ප්‍රායෝගිකව වඩාත් යෝග්‍ය වන්නේ,
(1) ප්‍රශ්නාවලි ක්‍රමයයි. (2) නිරීක්ෂණ ක්‍රමයයි.
(3) නිරීක්ෂණය හා ප්‍රශ්නාවලි ක්‍රමයයි. (4) ප්‍රශ්නාවලි සහ සම්මුඛ සාකච්ඡා ක්‍රමයයි.

8. චිත්‍රපටයක ව්‍යුහාත්මක සැකැස්ම මූලික වශයෙන් තීරණය වන්නේ,
(1) තිර පිටපත මත ය. (2) සංස්කරණ ක්‍රියාවලිය මත ය.
(3) රංගන කාර්ය මත ය. (4) නිෂ්පාදකවරයාගේ අරමුණ මත ය.

9. ශ්‍රී ලංකාවේ මුද්‍රණ ශිල්පය ආරම්භ වන්නේ,
(1) පෘතුගීසි පාලන සමයේ දී ය. (2) ඉංග්‍රීසි පාලන සමයේ දී ය.
(3) ලන්දේසි පාලන සමයේ දී ය. (4) පශ්චාත් යටත් විජිත පාලන සමයේ දී ය.

[දෙවැනි පිටුව බලන්න.

10. 'ප්‍රදීපාගාර උපක්‍රමය' වඩාත් අදාළ වන්නේ,
(1) ශ්‍රව්‍ය සන්නිවේදනයට ය.
(2) ජන සන්නිවේදනයට ය.
(3) සමූහ සන්නිවේදනයට ය.
(4) පුද්ගලාන්තර සන්නිවේදනයට ය.

11. "ඕනෑම පෙළපොතක් සම්පූර්ණයෙන් ම ඡායා පිටපත් කර කඩිනමින් ලබා ගැනීමට අප වෙත බාර දෙන්න." යනුවෙන් දැන්වීමක් පොත් සාප්පුවක ප්‍රදර්ශනය කර තිබිණි. එසේ බාර ගැනීම,
(1) සන්නිවේදන තාක්ෂණයේ ප්‍රගතිය පෙන්නුම් කළ ද කර්තෘගේ සදාචාර අයිතිය උල්ලංඝනය කිරීමකි.
(2) පුද්ගලයින් සතු භාෂණයේ හා ප්‍රකාශනයේ හිමිකම අවස්ථානුකූල ව ප්‍රයෝජනයට ගැනීමකි.
(3) ලේඛකයාගේ ආර්ථික අයිතිවාසිකම උල්ලංඝනය කෙරෙන නිසා නීති විරෝධී වූවකි.
(4) පිටපත් බහුලීකරණයේ තාක්ෂණික ශක්‍යතාව මානව අවශ්‍යතා තෘප්ත කරන අයුරු පෙන්නුම් කරන්නකි.

12. "ගුවන් යානයක් නිසි වේලාවට ගුවන්තොටුපළින් පිටත් වීම ප්‍රවෘත්තියක් නොවේ." මෙම ප්‍රකාශයෙන් අදහස් කෙරෙන්නේ,
(1) ප්‍රවෘත්තිමය සිදුවීම් ඕනෑම තැනක සිදු විය හැකි බවයි.
(2) ප්‍රවෘත්ති යනු බොහෝ විට අහම්බ සිදුවීම් බවයි.
(3) 'පුවත් ඉව' වැදගත් සිදුවීම් හඳුනාගැනීමට ඉවහල් වන බවයි.
(4) සෑම සිද්ධියක් ම ප්‍රවෘත්තියක් වීමට ඇත්තේ අඩු ඉඩක් බවයි.

13. දේශනයක් පවත්වන අතරතුර කිසියම් පොතක ඇතුළත් රූපසටහනක් පෙර සූදානමකින් තොරව ශ්‍රාවක පිරිස වෙත ඉදිරිපත් කිරීමට ඔබට අවශ්‍ය වෙයි. ඊට ඔබ තෝරා ගන්නේ,
(1) ක්ෂණික ප්‍රක්ෂේපණ යන්ත්‍රයයි.
(2) බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රයයි.
(3) ප්‍රතිශීර්ෂ ප්‍රක්ෂේපණ යන්ත්‍රයයි.
(4) ස්ලයිඩ් ප්‍රක්ෂේපණ යන්ත්‍රයයි.

14. එක්තරා සන්නිවේදන වර්ගයක ගුණාංග කිහිපයක් මෙසේ හඳුනාගත හැකි විය.
A - එය කුළුපග මෙන් ම සෘජු ය.
B - සන්නිවේදකයා හා ග්‍රාහකයා එක හා සමාන තත්ත්වයෙන් සිය භූමිකා නිරූපණය කරයි.
C - එසැණින් ප්‍රතිපෝෂණයක් සිදු වේ.
ඉහත නිරීක්ෂණවලට වඩාත් සමීප සන්නිවේදන වර්ගය වන්නේ,
(1) කණ්ඩායම් සන්නිවේදනයයි.
(2) අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනයයි.
(3) අන්තර් පුද්ගල සන්නිවේදනයයි.
(4) ජන සන්නිවේදනයයි.


15. පුවත්පත් මාධ්‍යයේ දී පිටපතක ඇති කරුණුවල නිරවද්‍යතාව, ලේඛන ශෛලිය හා ව්‍යාකරණ පිළිබඳ පරීක්ෂා කිරීම සම්බන්ධයෙන් වගකීම පැවරෙන්නේ,
(1) උපසංස්කාරකට ය.
(2) ප්‍රධාන සංස්කාරකට ය.
(3) ප්‍රවෘත්ති සංස්කාරකට ය.
(4) ප්‍රවෘත්ති වාර්තාකරුවාට ය.

16. පරිගණක අකුරු සැකසීම, පිටු සැලසුම හා ඡායාරූප සංස්කරණය මූලික අවශ්‍යතාවක් වන්නේ,
(1) ලෙටර්ප්‍රෙස් මුද්‍රණයේ දී ය.
(2) පරිගණක ආශ්‍රිත ප්‍රකාශනයේ දී ය.
(3) ස්ක්‍රීන් මුද්‍රණයේ දී ය.
(4) ලිතෝග්‍රැෆි මුද්‍රණයේ දී ය.

17. දිනපතා පුවත්පතක පළ වූ ප්‍රවෘත්ති කිහිපයක් පහත දැක්වේ.
A - නුවරඑළියේ දී බස් අනතුරකින් 14 ක් මරුට
B - හිටපු ක්‍රිකට් ක්‍රීඩකයෙක් විවාහ වෙයි.
C - හෝලි පූජාව මඩකලපුවේ දී පැවැත්වේ.
D - රාජ්‍ය සේවකයන්ගේ ජීවනාංක දීමනාව ඉහළ නංවයි.
එම ප්‍රවෘත්ති අනුපිළිවෙළින් දෘඪ (Hard) සහ මෘදු (Soft) පුවත් ලෙස නිවැරදි ව වර්ග කර ඇති පිළිතුර තෝරන්න.
(1) දෘඪ, මෘදු, දෘඪ, මෘදු
(2) දෘඪ, මෘදු, මෘදු, දෘඪ
(3) දෘඪ, දෘඪ, මෘදු, මෘදු
(4) මෘදු, දෘඪ, මෘදු, දෘඪ

18. පුවත්පත්වල පළ වූ ප්‍රවෘත්ති අතුරෙන් වැඩි ම කැමැත්තක් ඇති ප්‍රවෘත්තිය තෝරා ගැනීමට යොදා ගත හැකි වඩාත් ගැළපෙන විධික්‍රමය වන්නේ,
(1) ප්‍රශ්නාවලි ක්‍රමයයි.
(2) අන්තර්ගත විශ්ලේෂණයයි.
(3) බෙදාහරින්නන් සමඟ සම්මුඛ සාකච්ඡාවයි.
(4) නිරීක්ෂණයයි.

19. පහතින් දක්වා ඇති රූපසටහන් සලකන්න:




එම රූප සටහන් අතුරෙන්
(1) සියල්ල සංකේත වන අතර සමහරක් නිර්වාචික ස්වභාවයක් උසුලයි.
(2) සියල්ල සංකේත නොවුණත් සමහරක් වාචික ස්වභාවයක් උසුලයි.
(3) සියල්ල නිර්වාචික වන අතර සමහරක් දෘශ්‍ය සන්නිවේදනයක් සිදු කරයි.
(4) සියල්ල නිර්වාචික වන අතර සමහරක් වාචික සන්නිවේදනයක් සිදු කරයි.

[තුන්වැනි පිටුව බලන්න.

20. ඔබ සිටින ස්ථානයේ ම රැඳී සිටිමින් මදක් දුරින් පිහිටි වස්තුවක් සහ ඔබ සමීපයේ ඇති වස්තුවක් ඡායාරූපගත කිරීමට ඔබට අවශ්‍ය වේ. ඊට වඩාත් යෝග්‍ය වන්නේ,
(1) පුළුල් කෝණ කාචයයි. (2) යුහුඹු කාචයයි. (3) සාමාන්‍ය කාචයයි. (4) දුර රූප කාචයයි.

21. සමාජයක 'ප්‍රතිරූප ගොඩනැංවීම' ගැන පන්ති කාමරයේ දී සාකච්ඡාවක් මතු විය.
අමල් :- ප්‍රතිරූප ගොඩනැංවීම බොහෝවිට සිදු වන්නේ ජනමාධ්‍ය මගින්
විමල් :- ක්‍රීඩාව, දේශපාලනය හා රංගනය වැනි ක්ෂේත්‍රවලට අයිති අය විතරයි ප්‍රතිරූප බවට පත්වන්නේ
කමල් :- ජනමාධ්‍ය මගින් ප්‍රතිරූප ගොඩනැංවීම වගේ ම බිඳදැමීමත් සිදු කෙරෙනවා
ඉහත පුද්ගලයන් අතුරෙන් නිවැරදි අදහස් ඉදිරිපත් කරන්නේ,
(1) අමල් හා කමල් පමණි. (2) අමල් හා විමල් පමණි.
(3) විමල් හා කමල් පමණි. (4) අමල්, විමල් හා කමල් යන තිදෙනා ම ය.

22. පාඩම අවසානයේ දී සිසුන්ට ඇති ගැටලු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම ගුරුතුමාගේ පුරුද්ද විය. මේ බව දත් සීතා එදින ද එම අවස්ථාව එළඹෙන තෙක් බලා සිටියා ය. මෙහි දී ඇය ප්‍රයෝජනයට ගන්නා සන්නිවේදන ක්‍රියාවලියට අයත් මූලිකාංගය වන්නේ,
(1) බලපෑමයි. (2) අත්දැකීම් පසුතලයයි. (3) සන්දර්භයයි. (4) ප්‍රතිපෝෂණයයි.

23. මැතිවරණයක දී සිය ස්ථාවරය ජනතාව වෙත දැනුම් දීමට එක්තරා දේශපාලන පක්ෂයකට අවශ්‍ය විය. ඒ සඳහා සිය මූලස්ථානයේ දී නිශ්චිත දිනයක, නිශ්චිත වේලාවක දී පක්ෂයේ ප්‍රධානින්ගේ මූලිකත්වයෙන් කරුණු ඉදිරිපත් කිරීමට තීරණය විය. ඒ සඳහා සහභාගි වන ලෙස විවිධ මාධ්‍ය ආයතන වෙත දන්වා යවන ලදී. මෙසේ කරුණු ඉදිරිපත් කිරීම
(1) සම්මුඛ සාකච්ඡාවකි. (2) ප්‍රවෘත්ති නිවේදනයකි.
(3) ප්‍රවෘත්ති සාකච්ඡාවකි. (4) නිල නිවේදනයකි.

24. ගවේෂණාත්මක ප්‍රවෘත්ති කලාව යනු
(1) බීට්ටු වාර්තාකරුවන් වැඩි වශයෙන් භාවිත කෙරෙන වාර්තාකරණයකි.
(2) නිල පොලිස් මූලාශ්‍ර භාවිත කරමින් සිදු කෙරෙන වාර්තාකරණයකි.
(3) සිදුවීම්වලට සමාන්තරව සිදු කෙරෙන වාර්තාකරණයකි.
(4) සඟවා ඇති තොරතුරු එක්රැස්කර වාර්තා කිරීමකි.

25. ගුවන් විදුලි නාට්‍ය සම්බන්ධයෙන් **නොගැළපෙන** ප්‍රකාශය තෝරන්න.
(1) චරිත රැසක් යොදා ගනු ලැබේ. (2) බොහෝවිට ශබ්ද ප්‍රයෝග භාවිත කරයි.
(3) මනස තුළ චිත්ත රූප මවනු ලබයි. (4) අවස්ථා උද්දීපනයට සංගීතය යොදා ගනු ලැබේ.

26. දිනපතා පුවත්පතක මුල් පිටුවේ බොහෝවිට ඇතුළත් වන්නේ,
(1) රාජ්‍ය ප්‍රවෘත්ති ය. (2) දෘඪ ප්‍රවෘත්ති ය.
(3) නිල ප්‍රවෘත්ති ය. (4) මෘදු ප්‍රවෘත්ති ය.

27. ඩී. ආර්. විජේවර්ධන, ඇම්. ඩී. ගුණසේන සහ උපාලි විජේවර්ධන යන චරිත හඳුනාගන්නේ,
(1) ශ්‍රී ලංකාවේ කැපීපෙනෙන පුවත්පත් සංස්කාරකවරුන් ලෙස ය.
(2) ශ්‍රී ලංකාවට රූපවාහිනිය හඳුන්වා දීමට පුරෝගාමීවූවන් ලෙස ය.
(3) ශ්‍රී ලංකාවේ පුවත්පත් කර්මාන්තයේ කැපීපෙනෙන චරිත ලෙස ය.
(4) ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ජනප්‍රිය වැඩසටහන් සම්පාදකවරුන් ලෙස ය.

28. පුවත්පත් ඡායාරූප පිළිබඳ වැකි කිහිපයක් පහත දැක්වේ.
A - සාක්ෂරතාවයෙන් තොර අයට වැදගත් වේ.
B - පුවතක විශ්වසනීයත්වය වැඩි වේ.
C - පුවත්පතට ආකර්ශනීය පෙනුමක් ලැබේ.
ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ,
(1) A හා B පමණි. (2) A හා C පමණි.
(3) B හා C පමණි. (4) A, B හා C යන සියල්ල ම ය.

29. ආධුනික ඡායාරූප ශිල්පියකුගේ දෘෂ්ටිකෝණයෙන් සාමාන්‍ය දළ සේයාපට කැමරාවලට වඩා ඩිජිටල් කැමරා වැදගත් වන්නේ එමගින් ඡායාරූප,
(1) ක්ෂණික ව නැරඹිය හැකි බැවිනි. (2) පහසුවෙන් තැන්පත් කරගත හැකි බැවිනි.
(3) විශාල පිරිසකට යැවිය හැකි බැවිනි. (4) විශාල කර මුද්‍රණය කළ හැකි බැවිනි.

30. රූපවාහිනි ප්‍රවෘත්ති සම්බන්ධයෙන් **නොගැළපෙන** ප්‍රකාශය තෝරන්න.
(1) බොහෝවිට සජීවී ව ඉදිරිපත් කරයි. (2) නාලිකා අතර තරගකාරී තත්ත්වයක් පවතී.
(3) ගුවන් විදුලි ප්‍රවෘත්තිවලට වඩා වේගවත් වේ. (4) හැකි සෑම විට ම ඡායාරූප දර්ශන යොදා ගනී.

[හතරවැනි පිටුව බලන්න.

09916

31. සමථකරණය, මැදිහත්කරණය හා බේරුම්කරණය යන සිද්ධාන්තවලට අදාළ ව ක්‍රියාත්මක වන මුද්‍රිත මාධ්‍ය හා සම්බන්ධ ආයතනයක් වන්නේ,
(1) ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමයි. (2) ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයයි.
(3) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමයි. (4) ශ්‍රී ලංකා කර්තෘ සංසදයයි.

32. ශබ්දය, විද්‍යුත් ශක්තියක් බවට හරවා එක් තැනක සිට තවත් තැනකට යැවිය හැකි බව මුල්වරට හෙළි කළේ,
(1) ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම් බෙල් ය. (2) තෝමස් අල්වා එඩිසන් ය.
(3) ජේම්ස් ක්ලාක් මැක්ස්වෙල් ය. (4) ගුග්ලිල්මෝ මාර්කෝනි ය.

33. 10 සහ 11 ශ්‍රේණිවල ළමුන්ගේ පුවත්පත් කියවීමේ රටාව සොයා බැලීම සඳහා සමීක්ෂණයක් සිදු කිරීම සීතාට අවශ්‍ය විය. එකී සමීක්ෂණයේ දී ඉහත ශ්‍රේණිවල ළමුන් සැලකෙන්නේ,
(1) නියැදිය ලෙස ය. (2) ජනගහනය ලෙස ය.
(3) ඉලක්ක ග්‍රාහක පිරිස ලෙස ය. (4) දත්ත දායකයන් ලෙස ය.

34. "ගුවන් විදුලිය යනු ග්‍රාහක කේන්ද්‍රීය මාධ්‍යයකි." මින් අදහස් වන්නේ,
(1) ගුවන් විදුලි වැඩසටහන්වල ග්‍රාහක දායකත්වය වැඩි බවයි.
(2) ග්‍රාහක මනාපය මත තෝරාගැනීම් සිදු කරන බවයි.
(3) ග්‍රාහක ඉල්ලීම්වලට වැඩි තැනක් ලබාදෙන බවයි.
(4) ග්‍රාහකයා ඉලක්ක කරගත් වැඩසටහන් ඉදිරිපත් කරන බවයි.

35. පුවත්පතක සංස්කාරක මණ්ඩලයට අයත් වන්නේ,
(1) ප්‍රධාන සංස්කාරක, උපසංස්කාරක, ඡායාරූප ශිල්පීන් සහ පිටු සැලසුම් ශිල්පීන් ය.
(2) නියෝජ්‍ය සංස්කාරක, විචිත්‍රාංග ලේඛකයින්, දැන්වීම් කළමනාකරු සහ මාණ්ඩලික වාර්තාකරුවන් ය.
(3) ප්‍රධාන සංස්කාරක, දැන්වීම් කළමනාකරු, මුද්‍රණ කළමනාකරු සහ බෙදාහැරීම් කළමනාකරු ය.
(4) අධ්‍යක්ෂ, ප්‍රධාන සංස්කාරක, උපසංස්කාරක සහ මාණ්ඩලික වාර්තාකරුවන් ය.

36. පුහුණු අවස්ථාවක් ලබා ගැනීම සඳහා ඔබගේ ජීව දත්ත ඇතුළත් වාර්තාවක් සකස් කිරීමට සිදුව ඇතැයි සිතන්න. එහි දී අදාළ බලධාරීන්ගේ අවධානය දිනා ගැනීම සඳහා **අවම** වැදගත්කමක් ඇත්තේ,
(1) තම විනෝදාංශ හා විශේෂ රුචිකත්වයන් ඊට ඇතුළත් කිරීමයි.
(2) කලාත්මක අක්ෂර රටා හා වර්ණවත් කඩදාසි භාවිතයයි.
(3) වාර්තාවට අමතර ව තම ඉල්ලීම හා කැපවීම සඳහන් කර තවත් අමතර ලිපියක් යොමු කිරීමයි.
(4) වාර්තාව සකස් කිරීම සඳහා A4 ප්‍රමාණයේ කඩදාසි පමණක් භාවිත කිරීමයි.

37. අඬමින් සිටින කුඩා දරුවකුගේ මුහුණක්, ඈතින් එන කාන්තාවක්, එම කාන්තාවගේ සමීප රූපයක් සහ කුඩා දරුවා සිනහවෙන රූපයක් එකට සංස්කරණය කර තිබේ. මෙම රූප මගින් අර්ථයක් මතුවීම හඳුන්වනු ලබන්නේ,
(1) සමෝධානය යනුවෙනි. (2) අතීතාවර්ජනය යනුවෙනි.
(3) දෘෂ්ටියේ අඛණ්ඩතාව යනුවෙනි. (4) අන්තර් ඡේදනය යනුවෙනි.

38. රෝහලක ප්‍රතිකාර ගනිමින් සිටින සුප්‍රසිද්ධ පුද්ගලයකු ඒ තුළ හැසිරෙන ආකාරය පිළිබඳ සත්‍ය විස්තර ඇතුළත් වාර්තාවක් පළ කිරීම,
(1) වැඩි දෙනකුගේ අවධානයට යොමු වන කරුණක් නිසා යුක්තිසහගත වූවකි.
(2) සදාචාර සම්පන්න නොවන නිසා කිසිසේත් ම නොකළ යුත්තකි.
(3) නීති විරෝධී කාරණයක් වන හෙයින් දඬුවමට යටත් කළ හැකි තත්ත්වයකි.
(4) පොදු ජන යහපත පිණිස හේතු වන්නේ නම් සාධාරණ වූවකි.

39. පාසලේ සියවස් සංවත්සරය වෙනුවෙන් පාසල් මාධ්‍ය ඒකකය නිර්මාණය කරන වාර්තා චිත්‍රපටය සඳහා පහත සඳහන් දර්ශන පටිගත කරයි.
A - විදුහල්පතිතුමා සමඟ සාකච්ඡාව
B - විදුහල්පති කාර්යාලය
C - පාසලේ සමස්ත දර්ශනය
පාසල හඳුන්වාදීම සඳහා ඉහත දර්ශන පෙළ අර්ථවත් ව පෙළගැස්විය යුතු ආකාරය වන්නේ,
(1) A, B හා C වශයෙනි. (2) A, C හා B වශයෙනි.
(3) B, A හා C වශයෙනි. (4) C, B හා A වශයෙනි.

40. A - ක්‍රීඩා තරග විස්තර විචාරයක්
B - මැතිවරණ ප්‍රතිඵල විකාශයක්
C - ප්‍රධාන ප්‍රවෘත්ති ප්‍රකාශයක්
ඉහත වැඩසටහන් අතුරෙන් ගුවන් විදුලි සජීවී වැඩසටහන්වලට අයත් වන්නේ,
(1) A හා B ය. (2) A හා C ය. (3) B හා C ය. (4) A, B හා C යන සියල්ල ම ය.

* *

[පස්වැනි පිටුව බලන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**87 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2014 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2014 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2014

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I, II
தொடர்பாடலும் ஊடகக் கல்வியும் I, II
Communication and Media Studies I, II

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II

* **පළමුවන** ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක්** ද ඇතුළු ව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* **පළමුවන** ප්‍රශ්නයට ලකුණු **20**ක් හිමි වන අතර, අනෙකුත් සෑම ප්‍රශ්නයකට ම ලකුණු **10** බැගින් හිමි වේ.

**1.** ගුවන් විදුලි නාලිකාවක් මගින් පවත්වන ලද ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනකින් ප්‍රථම ස්ථානය ලැබූ රවීට විදෙස් සංචාරයක් සඳහා අවස්ථාව උදා විය.

(i) ගුවන් විදුලි මාධ්‍යයේ විශේෂතා **දෙකක්** නම් කරන්න.

(ii) ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනක් මගින් ඉටු කර ගත හැකි සන්නිවේදන අරමුණු **දෙකක්** කෙටියෙන් දක්වන්න.

(iii) තරග ජයග්‍රහණය පිළිබඳ ප්‍රවෘත්තිය දිනපතා පුවත්පත් කිහිපයක ම වාර්තා කර තිබුණි. එම ප්‍රවෘත්තිවල මූල පාඨයෙහි අන්තර්ගතව තිබීමට ඉඩ ඇති කරුණු **හතරක්** සඳහන් කරන්න.

(iv) ජයග්‍රහණය තහවුරු කරමින් ඔහු වෙත ලබා දුන් ලිපියෙහි පිටපතක් සිය විදෙස් නියෝජිතයා වෙත ඉතා ඉක්මනින් යවන ලෙස ඉහත ගුවන් විදුලි නාලිකාව රවීට දැන්විය. එම පිටපත විදෙස් නියෝජිතයා වෙත යොමු කළ හැකි වඩාත් යෝග්‍ය හා කඩිනම් විධික්‍රමය කවරේ ද?

(v) තරග ජයග්‍රහණය නිමිති කොට ගෙන කෙටි ගුවන් විදුලි සාකච්ඡාවක් සඳහා සහභාගි වන ලෙස ගුවන් විදුලි ළමා වැඩසටහන් නිෂ්පාදකවරයෙක් රවීට ආරාධනා කළේ ය. ගුවන් විදුලි වැඩසටහන් නිෂ්පාදකවරයකු සතු කාර්ය **දෙකක්** කෙටියෙන් දක්වන්න.

(vi) විදෙස්ගතව සිටින කාලය තුළ තම පවුලේ සාමාජිකයන් සමඟ අන්තර්ජාලය ඔස්සේ ලිඛිත සම්බන්ධතාවක් පවත්වා ගැනීමට රවීට යොදාගත හැකි පහසු ම විධික්‍රමය කුමක් ද?

(vii) ඉහත විධික්‍රමය ඔස්සේ හුවමාරු කරගත හැකි වෙනත් ආකාරයක තොරතුරු වර්ග **දෙකක්** පිළිබඳ නිදසුන් දක්වන්න.

(viii) අන්තර්ජාල සම්බන්ධතාවයේ දුර්වල බව තොරතුරු හුවමාරුවට අහිතකර ලෙස බලපෑමට ඉඩ තිබේ. ෂැනන් හා වීවර්ට අනුව, එවන් අවස්ථාවකට අදාළ සන්නිවේදන මූලිකාංගය කෙටියෙන් හඳුන්වන්න.

(ix) විදේශගතව සිටින කාලය තුළ ආගිය විශේෂ ස්ථාන තම ඩිජිටල් කැමරාවෙන් ඡායාරූපගත කර ගැනීමට රවී අදහස් කරයි. ඩිජිටල් ඡායාරූප තාක්ෂණයේ ආගමනය ඡායාරූපකරණය මත ඇති කළ බලපෑම් **දෙකක්** සඳහන් කරන්න.

(x) ආපසු පැමිණි විගස සිය පන්තියේ මිතුරු මිතුරියන් වෙත සංචාරයේ තොරතුරු සවිස්තරව ඉදිරිපත් කිරීමට රවී අපේක්ෂා කරයි. ඒ සඳහා ඔහුට භාවිත කළ හැකි ප්‍රක්ෂේපණ උපකරණ **දෙකක්** නම් කරන්න.

**2.** (i) "*සරසවි සඳරැස* යනු ප්‍රථම සිංහල පුවත්පතයි."
ඉහත ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද? ඔබගේ පිළිතුරට හේතුව දක්වන්න.

(ii) "පිටකවරය යනු පොතක අනිවාර්ය අංගයක් නොවේ."
ඉහත ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද? ඔබගේ පිළිතුරට හේතු **දෙකක්** කෙටියෙන් දක්වන්න.

(iii) "ප්‍රවෘත්ති වාර්තාකරණයේ දී වඩා ගැළපෙන්නේ යටිකුරු පිරමීඩාකාර ක්‍රමයයි."
ඉහත ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද? ඔබගේ පිළිතුර හේතු **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න.

(iv) "සිනමාව යනු අධ්‍යක්ෂවරයාගේ මාධ්‍යයයි."
ඉහත ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද? ඔබගේ පිළිතුර හේතු **හතරක්** ඇසුරෙන් පැහැදිලි කරන්න.

**3.** පන්තියේ සිසු සිසුවියන් අමතා 'සන්නිවේදනයේ කාර්යයන්' පිළිබඳ ව කථාවක් පැවැත්වීමට ඔබට බාරව තිබේ.

(i) මෙය කවර සන්නිවේදන වර්ගයකට අයත් වන්නේ ද?

(ii) මෙම අවස්ථාවේ දී ඔබ 'ප්‍රදීපාගාර උපක්‍රමය' භාවිතයට ගන්නා ආකාරය පැහැදිලි කරන්න.

(iii) දේශනය වඩාත් ආකර්ෂණීය ලෙස පැවැත්වීම සඳහා ඔබ භාවිත කිරීමට අදහස් කරන නිර්වාචික සන්නිවේදන විධික්‍රම **තුනක්** වෙන වෙන ම පැහැදිලි කරන්න.

(iv) ජනසන්නිවේදනයේ මූලික ලක්ෂණ **හතරක්** විස්තර කරන්න.

[හයවැනි පිටුව බලන්න.

**4.** පාසල් මලල ක්‍රීඩා උළෙලේ එක් ඉසව්වක් වූයේ මැරතන් ධාවන තරගයයි.

(i) ධාවන තරගය අතරතුර මාර්ගයේ ඉඩකඩ ලබා ගැනීම සඳහා භාවිත කරන ප්‍රධාන සන්නිවේදන උපකරණය කුමක් ද?

(ii) මැරතන් තරගය ජංගම දුරකථනවලින් වීඩියෝගත කර තිබුණි. ඊට අමතර ව තරගයට අදාළ ව ජංගම දුරකථනය යොදා ගත හැකි අවස්ථා **හතරක්** නම් කරන්න.

(iii) වීඩියෝ දර්ශන ඇසුරෙන් කෙටි වාර්තා චිත්‍රපටයක් නිෂ්පාදනය කරන ලදී. වාර්තා චිත්‍රපටයක ප්‍රධාන ලක්ෂණ **තුනක්** කෙටියෙන් පැහැදිලි කරන්න.

(iv) ධාවන තරගය පිළිබඳ එම කෙටි වාර්තා චිත්‍රපටයට පහත රූප අර්ථාන්විතව ඇතුළත් කිරීමට අවශ්‍යව ඇත. ඒ සඳහා උචිත දර්ශන ඒ ඒ රූපයට අදාළ ව වෙන වෙන ම දක්වන්න.

(a) සමීප රූපය
(b) මධ්‍යම රූපය
(c) දුර රූපය
(d) අති දුර රූපය

**5.** (i) මාර්ගවල ධාවනය වන රථවාහන නිරීක්ෂණයට මංසන්ධිවල සවිකර ඇති කැමරා පද්ධති හඳුන්වන නාමය කුමක් ද?

(ii) රජය විසින් ස්ථාපිත මාධ්‍ය නියාමන ආයතන **දෙකක්** නම් කර, ඒ ඒ ආයතන යටතේ නියාමනය වන ජනමාධ්‍ය වර්ගය බැගින් දක්වන්න.

(iii) ජනමාධ්‍ය හිමිකාරීත්වයේ ප්‍රධාන වර්ග **දෙක** දක්වා, ඒ එක් එක් වර්ගයට අයත් වන ශ්‍රී ලංකාවේ ගුවන් විදුලි හා රූපවාහිනී නාලිකා **දෙක** බැගින් නම් කරන්න.

(iv) සරල පන්තිකාමර උපකරණයක් වන කළුලෑල්ල භාවිත කිරීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු **හතරක්** කෙටියෙන් විස්තර කරන්න.

**6.** නවීන් නිදහස් පුවත්පත් කලාවේදියෙකි. එසේ ම ඔහු වැඩසටහන් නිෂ්පාදකයකු ලෙස ගුවන් විදුලි මාධ්‍ය සමඟ ද සබඳතා පවත්වයි.

(i) නවීන්ට වැදගත් වන අන්තර්ජාතික ප්‍රවෘත්ති ආයතන **දෙකක්** නම් කරන්න.

(ii) දේශීය ප්‍රවෘත්ති වාර්තාකරණයේ දී නවීන් උපයෝගී කරගනු ඇතැයි ඔබ විශ්වාස කරන ප්‍රවෘත්ති මූලාශ්‍ර **හතරක්** කෙටියෙන් හඳුන්වන්න.

(iii) නිෂ්පාදන කාර්යයේ දී නවීන්ට සිය දායකත්වය ලබාදිය හැකි ගුවන් විදුලි වැඩසටහන් වර්ග **තුනක්** පිළිබඳ ව වෙන වෙන ම විස්තර කරන්න.

(iv) පුවත්පත් හා ගුවන් විදුලි මාධ්‍යයන්හි දී භාෂා භාවිතය සම්බන්ධයෙන් දැකිය හැකි ප්‍රධාන වෙනස්කම් **හතරක්** නිදසුන් සහිත ව පැහැදිලි කරන්න.

**7.** ජනමාධ්‍ය සංදේශ නිවැරදිව ග්‍රහණය කර ගැනීමෙන් ග්‍රාහකයා දැනුම්වත් පුරවැසියෙක් බවට පත්වේ.

(i) ප්‍රධාන ජනමාධ්‍ය ග්‍රාහක ස්වරූප **දෙකක්** නම් කරන්න.

(ii) ඉහත සඳහන් කළ ග්‍රාහක දෙවර්ගයට අදාළ ගුණාංග **දෙක** බැගින් වෙන වෙනම සඳහන් කරන්න.

(iii) ජනමාධ්‍ය විසින් ළමයා මත ඇති කරන සෘණාත්මක බලපෑම් **තුනක්** කෙටියෙන් විස්තර කරන්න.

(iv) විචාරශීලී ග්‍රාහකයකු සතු විය යුතු මූලික ගුණාංග **හතරක්** වෙන් වෙන් ව විස්තර කරන්න.

* * *

PAST PAPERS WIKI